## ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය - 2017

---

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 50(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6)වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අගෝස්තු 15 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණයන් පමණක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම  කළමනාකරණයේ වගකීම වේ.

### 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2017 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2018 අගෝස්තු 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම

---

අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්,වගකීම්,ආදායම් හා වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම** |
|---|---|
| | **(රු.)** |
| **වත්කම්** | |
| ජංගම නොවන වත්කම් | 1,080,797,130 |
| ජංගම වත්කම් | 417,284,131 |
| **මුළු වත්කම්** | **1,498,081,261** |

**ස්කන්ධය හා වගකීම්**
**--------------------------**

| | |
|---|---|
| ස්කන්ධය | 1,372,782,112 |
| **වගකීම්** | |
| **----------** | |
| ජංගම නොවන වගකීම් | 79,404,647 |
| ජංගම වගකීම් | 45,894,502 |
| | ------------------ |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | **1,498,081,261** |
| | ========== |
| මුළු ආදායම | 445,107,910 |
| මුළු වියදම | 439,680,794 |
| | ----------------- |
| **අතිරික්තය** | **5,427,116** |
| | ======== |

**2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**
**-----------------------------------**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ලංකා විදුලිබල මණ්ඩලයට 2012 නොවැම්බර් මාසයේදී ආර්සීඑල් (Regional Centre for Lighting) මධ්‍යස්ථානයේ කළමනාකරණය සහ වත්කම් පවරා දීමේදී හිඟ බදු කුලී ලෙස බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පදනමට ගෙවිය යුතුව පැවති රු.8,033,270 ක් ගෙවා තිබුණු අතර 2018 අගෝස්තු 30 දින දක්වා ලංකා විදුලිබල මණ්ඩලයෙන් අය කර ගෙන නොතිබුණි.

**2.4 නීතිරීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**
**--------------------------------------------------------------------**

විගණනයේ දී නිරීක්ෂණය වු අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| **නීතිරීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| **(අ) 2007 අංක 35 දරන සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පනත** | |
| 46 (3) වගන්තිය | බලශක්ති අරමුදලෙහි අරමුණට පටහැනිව සුනිත්‍ය බලශක්ති අධිකාරියට කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීමට හා එම ගොඩනැගිල්ලෙහි සැලසුම් සකස් කිරීම සඳහා 2015, 2016 හා 2017 යන වර්ෂ වලදී එකතුව රු. 54,263,517 ක් අධිකාරිය විසින් එම අරමුදලේ ආයෝජන වලින් ඉවත්කර ගෙන තිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

-------------------------------------

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 454 | මුදල් රෙගුලාසි ප්‍රකාරව බඩු ලේඛන පොත් පවත්වා නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 757(1) | අදාල ආකෘති පත්‍ර පදනම් කරගෙන වත්කම් භෞතික සත්‍යාපනය කර නොතිබුණි. |

**(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ**

------------------------

| | | |
|---|---|---|
| (i) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව එකතුව රු. 1,961,896,952 ක් වූ ස්ථාවර වත්කම් සඳහා වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ii) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛය | වටිනාකම රු.14,973,433 ක් වූ පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

**(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

---------------------------

| | |
|---|---|
| 2011 දෙසැම්බර් 12 දිනැති අංක 28/2011 දරන චක්‍රලේඛය | වෘත්තීය දීමනාව සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් පමණක් හිමිකම් ලබන නමුත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට නොගැනෙන අධිකාරියේ ඉංජිනේරු තනතුර දරන නිලධාරීන් සඳහා 2016 අගෝස්තු මාසයේ සිට 2018 මැයි මාසය දක්වා රු.7,980,000 ක මුදලක් වෘත්තීය දීමනා ලෙස අධිකාරිය විසින් ගෙවා තිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) "ස්විච්-ඒෂියා" වැඩසටහන යටතේ යුරෝපා සංගමයෙන් ලැබී තිබුණු රු. 7,334,354 ක මුදලින් රු.3,135,202 ක්, 1994 ජූනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව 2010 හා 2011 වර්ෂයන්හි දී අධිකාරියේ සියලු නිලධාරීන් සඳහා වෘත්තීය දීමනා ලෙස ගෙවා තිබුණි. නීත්‍යානුකූල නොවන මෙම ගෙවීම අදාල නිලධාරීන්ගෙන් හෝ ඊට වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකිරීමට අමාත්‍යාංශයේ ලේකම් විසින් 2012 දෙසැම්බර් 03 දින දෙන ලද නියෝගය 2018 අගෝස්තු 30 දක්වාම ඉටුකර ගෙන නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 01 දින වසරක කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නව අධ්‍යක්ෂ ජනරාල්වරයාට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පනතේ 52 (4) වගන්තියට අනුව මාසිකව රු.250,000 ක වැටුපක් ගෙවා තිබුණද මෙතෙක් අදාල තනතුර සඳහා ආයතනය 2/2016 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව HM.2-3 කාණ්ඩය යටතේ ගෙවා තිබුණේ රු.98,215 පමණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

3.1.1 **සැලසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ කටයුතු කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කළ යුතු බැවින් අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක ළඟා කර ගැනීමට හැකිවන පරිදි ආයතනය මෙහෙයවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ වගකීම වුවද, 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව අධිකාරිය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් ක්‍රියාකාරි සැලැස්මක් වාර්ෂිකව පිළියෙල කරන නමුත් එහි ප්‍රගතිය සමාලෝචනය කර සමාලෝචිත වර්ෂය අවසානයට වාර්තාවක් සකස් කර නොතිබුණි.

(ඇ) අධිකාරිය විසින් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.1.2 **ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය**

පරමාර්ථ ඉටුකරගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) බලශක්ති විගණනය හා බලශක්ති සේවා සැපයීම**

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනත ප්‍රකාරව (Energy efficiency improvement ,Energy Auditing and Energy Service) අධිකාරිය විසින් බලශක්ති උපකරණ බාහිර ආයතනයන්ට කුලියට දීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2008 - 2012 යන කාලපරිච්ඡේදය තුළදී මිලදී ගෙන තිබූ උපකරණ වර්තමානයේ ද භාවිතා කරන නමුත් එම උපකරණ අලුත්වැඩියා කිරීමක් සිදුකර නොතිබුණු බැවින් මෙම මිණුම් උපකරණ භාවිතා කර ලබාගන්නා තොරතුරුවල නිරවද්‍යතාවය හා ගුණාත්මකභාවය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය.

(ii) එසේම මෙම උපකරණ අතරින් 2017 භාණ්ඩ සමීක්ෂණය මඟින් දෝෂ සහිත ලෙස හඳුනාගෙන තිබුණු උපකරණ අපහරණය කිරීමට, අලුත්වැඩියා කිරීමට හෝ නවීන උපකරණ මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) අධිකාරිය විසින් බලශක්ති මිනුම් උපකරණ කුලියට දීමේදී අයකරනු ලබන ගාස්තු 2010 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබූ අතර 2018 වර්ෂය දක්වාම මෙම ගාස්තු සංශෝධනයක් සිදුකර නොතිබුණි.

(iv) බලශක්ති සේවා අංශයේ කාර්ය මණ්ඩලය තුල ඉංජිනේරුවරයෙකු හා ඉංජිනේරු සහායක නිලධාරියා පමණක් සේවයේ යෙදී සිටීම නිසා සේවා සැපයීම හා උපකරණ නැවත භාරගැනීම ආදී කටයුතු ක්‍රමානුකූලව සිදුකිරීමට අපහසු බව විගණනයේදී නිරීක්ෂණය විය.මේ හේතුවෙන් සේවා සැපයිම පහත වැටීමක් සිදු වන අතර මිනුම් උපකරණ නැවත භාරගැනීමේදී පරීක්ෂා කිරීමකින් තොරව භාරගැනීමට සිදු වීම නිසා දෝෂ සහිතව උපකරණ භාරගනු ලැබූ අවස්ථා ද නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද සූර්ය බලශක්ති ව්‍යාපෘති 3 ක් හා සූර්ය බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති 3 ක් වෙනුවෙන් එකතුව රු. මිලියන 74.787 ක ප්‍රතිපාදන සුනිත්‍ය බලශක්ති අරමුදලින් සලසා ගෙන තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘති 4 ක කිසිදු කාර්යයක් සිදුකර නොතිබීම හේතුවෙන් මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණු අතර ව්‍යාපෘති 2 ක සියයට 0.2 සිට සියයට 1 කාර්යසාධනයක් පමණක් නිරීක්ෂණය විය.

## 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සඳහා ප්‍රධාන කාර්යාලයක් ඉදිකිරීම වෙනුවෙන් වසර 30 ක කල්බදු පදනම යටතේ 2015 ජූනි 22 දින රු.45,856,451 ක් වැයකර නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉඩමක් ලබාගෙන තිබුණි. නීතිමය උපදෙස් ලබාගැනීමකින් තොරව බදු ගිවිසුමකට එළඹ තිබීම හේතුවෙන් වසර 2 ක් තුල සංවර්ධන කටයුතු නිමකිරීමට අපොහොසත් වුවහොත් බදු දේපලේ අයිතිය බදුකරුට ලැබෙන බවට කොන්දේසියක් ඇතුළත්ව තිබුණි. එහෙත් 2018 සැප්තැම්බර් 30 දින වනවිට වසර 2 ½ ක් ඉක්ම ගොස් තිබුණද ගොඩනැගිල්ලේ සැලසුම් නිර්මාණ කටයුතු පමණක් සිදුකර තිබුණි.

(ආ) අධිකාරිය විසින් 2018 මැයි මාසයේදී අධිකාරියේ සේවයෙන් ඉවත්ව ගිය සේවා කාලය වර්ෂ 5 ඉක්ම වූ කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ සේවකයෙකු සඳහා විශ්‍රාමික පාරිතෝෂික ලෙස රු.160,090 ක් ගෙවා තිබුණ ද ඒ සඳහා වාර්ෂික වෙන් කිරීම් සිදු කර නොතිබුණි.

(ඇ) සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ආරම්භයේ සිට සේවක වැටුප් පරිවර්තනය කිරීමේ දී සිදු වූ දෝෂ සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනයේ වාර්තාව 2012 පෙබරවාරි 03 දින අධිකාරිය වෙත ඉදිරිපත් කර තිබුණ ද එහි සඳහන් නිර්දේශ ආයතනය විසින් මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. එම වාර්තාවට අනුව 2007 ඔක්තෝබර් 01 දින සිට 2011 සැප්තැම්බර් 30 දින දක්වා චක්‍රලේඛවලින් බැහැරව වැඩිපුර ගෙවන ලද රු. 2,171,760 ක වැටුප් හා දීමනා අදාල නිලධාරීන්ගෙන් අය කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිළධාරි ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා තිබුණද, ඒ අනුව අය කර ගැනිමට හෝ නිවැරදි කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ඈ) 2007 සැප්තැම්බර් 28 දින ඇති කර ගන්නා ලද ගිවිසුමකට අනුව මාස 18 ක් ඇතුළත ප්‍රොටොටයිප් විදුලි වාහන තුනක් සංවර්ධනය කිරීම සඳහා 2007 වර්ෂයේ දී බාහිර පාර්ශවයකට රු.7,956,800 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, 2018 අගෝස්තු 30 දින දක්වා වර්ෂ 10 ක් ගත වී තිබුණ ද , එක් වාහනයක් හෝ සංවර්ධනය කිරීමට සංවර්ධකට නොහැකි වී තිබූ අතර වාහන 03ක් සංවර්ධනය කරවා ගැනීමට හෝ ගෙවන ලද මුදල ආපසු අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් අධිකාරිය විසින් ගෙන නොතිබුණි.

### (ඉ) සුළං මාපක කුළුණු

--------------------

අන්තර්ජාතික මඟපෙන්වීම් (MEASNET Site Assossonent Guig Line 2 April 2016) අනුව සුළං බලාගාර ආකෘති නිර්මාණය සඳහා එක් වර්ෂයක් තුල අඛණ්ඩ පදනමින් එක් රැස් කළ දත්ත ප්‍රමාණවත් වන අතර දත්ත අතර සහසම්බන්ධතාවයක් (Co-Relation) පරීක්ෂා කිරීම සඳහා වර්ෂ 2-3 ක දත්ත ලබාගැනීම ප්‍රමාණවත් වේ. ඒ අනුව 2012 වර්ෂයට පෙර ස්ථාපිත කරන ලද කුළුණු 06 මඟින් ප්‍රමාණවත් දත්ත ලබාගෙන තිබුණද එම දත්ත උපයෝගී කර සුළං බල සම්පත් සිතියම් හා සැළසුම් සකස් කිරීම 2018 අගෝස්තු 31 දින දක්වාම අවසාන කර නොතිබුණි.

(ඊ) 2008 මාර්තු 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලංකා විදුලිබල මණ්ඩලය සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සංවර්ධනකරුවන් සඳහා “Cost based tariff ”ක්‍රමය යටතේ නව ගාස්තු ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ අනුව පිරිවැයෙන් සියයට 90 ක් ලංකා විදුලිබල මණ්ඩලය දැරීමටත් ඉතිරි සියයට 10 සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ප්‍රතිපූරණය කිරීමටත් තීරණය කර තිබුණි. මෙම තීරණය මත 2010 දෙසැම්බර් 31 දිනට සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු රු. 897,025,999 ක මුදල පියවීමට කිසිදු වැඩපිළිවලක් අධිකාරිය විසින් සකස් කර නොතිබුණි.

**3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) “ස්විච් -ඒෂියා” වැඩ සටහන යටතේ ලැබී ඉතිරිව ආපසු ගෙවිය යුතුව තිබූ රු.4,548,176 ක්හා ඉතිරි කිරීමේ ගිණුමක රු. 150,000,000 කට වැඩි මුදලක් වසර ගණනාවක සිට ආයෝජන කටයුත්තක් සඳහා යෙදවීමකින් තොරව තැන්පත් කර තිබුණි.

(ආ) අධිකාරිය සතු කැබ්රථයක් හා මෝටර් බයිසිකලයක් වසර 3 කට අධික කාලයක සිට නිෂ්ක්‍රියව පවතින අතර ඉහත කැබ් රථය ලංකා ඔටෝ මොබයිල් සංගමය මඟින් 2015 ජුනි 17 දිනැති තක්සේරු වාර්තාව මඟින් අපහරණය කිරීමට නිර්දේශ කර තිබුණි. නමුත් මෙම වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට 2018 අගෝස්තු 30 දින දක්වාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර කැබ් රථය එළිමහන් ස්ථානයක දිරාපත් වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රතිස්ථාපනය කිරීමේ නිර්දේශය මත ගලවා ඉවත් කරන ලද සාම්පූර් හා මුල්ලිපුරම සුළං මාපක කුළුණු කිසිදු ගිවිසුමක් නොමැතිව සේවා සැපයුම්කරු සතු කැප්පෙටිවලානේ පිහිටි පරිශ්‍රයකට ප්‍රවාහනය කර තිබූ අතර එම කුළුණු වලින් ගලවා ඉවත් කරන ලද උපකරණ අධිකාරිය වෙත භාරදුන් බවට කිසිදු ලේඛණයක් නොමැතිව සේවා සැපයුම්කරුට මුදල් නිදහස් කර තිබුණි. ගලවා ඉවත් කරන ලද දේපල නැවත භාවිතයට ගැනීමට හෝ සුදුසු පරිදි කටයුතු කිරීමට 2018 අගෝස්තු දක්වාම අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ඈ) නාඩුකුඩා සුළං මාපක කුළුණ සඳහා 2016 පෙබරවාරි මාසයේදී මිලදී ගත් රු. 1,775,025 ක වටිනාකමින් යුත් උපකරණ අතරින් රු.915,625 ක් වටිනා උපකරණ 2018 අගෝස්තු දක්වාම භාවිතයට ගෙන නොතිබුණු අතර අනෙකුත් උපකරණ මාස 11ක් පමණ ප්‍රමාද වී සවි කර තිබුණි.

**3.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 ඡේදය ප්‍රකාරව අධිකාරිය සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් සකස්කර අනුමත කරගෙන නොතිබුණි.

ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධිකාරිය සඳහා අනුමත කරන ලද කාර්ය මණ්ඩලය 2017 දෙසැම්බර් 31 දිනට 136 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 103 ක් විය. ඒ අනුව කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 33 ක් පැවති අතර මෙම පුරප්පාඩු අතර අධ්‍යක්ෂ තනතුරු 3 ක්, අංශ ප්‍රධාන තනතුරු 4 ක් හා කළමනාකරණ තනතුරු 12 ක් ද විය.

ඇ) ඉහත පරිදි පුරප්පාඩු වූ අධ්‍යක්ෂවරුන් තිදෙනා සහ අංශ ප්‍රධානීන් 4 න් 3 ක් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.1(ආ) ඡේදයේ

නියමයන්ගෙන් බැහැරව නිත්‍ය තනතුරේ පත්කිරීම් බලධාරියා වන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව අධිකාරියේ සභාපතිවරයා විසින් 2013 හා 2014 වර්ෂයන්හී දී වැඩ බැලීමේ තනතුරු සඳහා පත් කිරීම් සිදු කර තිබුණි. ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.7 ඡේදය හා VII වන පරිච්ඡේදයේ 12.2.6 ඡේදයට පටහැනි ලෙස 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වැඩ බැලීමේ දීමනා ලෙස එකතුව රු. 2,903,361 ක් ගෙවා තිබුණි.

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් ද තොරව අධිකාරියේ වැඩ බැලීමේ තනතුරු 06 සඳහා 2008 ජුලි 28 දිනැති අංක පීඊඩී/50 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2015 මැයි 25 දිනැති අංක පීඊඩී/01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ඉන්ධන දීමනා ලෙස රු. 2,610,880 ක් ද, අංශ ප්‍රධානී තනතුරු 03 හි අධ්‍යක්ෂවරයෙකු වෙනුවෙන් ප්‍රවාහන දීමනා වශයෙන් 2015 සිට 2017 වර්ෂය දක්වා රු. 4,210,000 ක් ද ගෙවා තිබුණි.

(ඉ) සුළං මාපක කුළුණු නඩත්තු කිරීම, කුළුණු මඟින් දත්ත එකතු කිරීම, මෘදුකාංග මඟින් දත්ත සකස් කිරීම හා ලිපිගොනු පවත්වාගෙන යාම යනාදී සියලු කාර්යයන් 2017 වර්ෂය ආරම්භයේ සිටම එක් තාක්ෂණික නිලධාරියෙකුට පමණක් සීමා වීම නිසා 2017 වර්ෂය සඳහා සැලසුම් කළ කාර්යසාධන ඉලක්ක ළඟා කරගැනීමට අපොහොසත් වී තිබූ අතර එය අනාගත කාර්යසාධනය කෙරෙහිද අහිතකර ලෙස බලපෑමේ අවදානමක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4. තිරසාර සංවර්ධනය

### 4.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු හා අදාලව දැරිය හැකි සහ පිවිතුරු බලශක්ති සැපයුම සම්බන්ධයෙන් "2030" න්‍යාය පත්‍රයට අනුව ඉලක්ක හඳුනා ගැනීම් හා එම ඉලක්ක හා ඉටු කර ගැනීම් අතර විචලනයන් හා ප්‍රගතිය මැනීමේ සුදුසු නිර්නායක ක්‍රියාකාරී සැලැස්ම තුළින් හඳුනා ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 5.1.1 ප්‍රසම්පාදනයන්

අධිකාරිය විසින් 2017 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම පිලියෙල කිරීම පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේ ප්‍රසම්පාදනයන් සඳහා රු.මිලියන 341.409 ක් ප්‍රසම්පාදන සැලැස්මෙන් ඇස්තමේන්තු කර තිබුණද වර්ෂය තුලදී සැලසුම්ගත ප්‍රසම්පාදනයෙන් රු.මිලියන 94.476 ක ප්‍රසම්පාදන කටයුතු පමණක් සිදු කර තිබුණි. ඒ අනුව අධිකාරිය ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේ දී ආයතනයේ අවශ්‍යතාවයන් ඉක්මවා ඇස්තමේන්තු සකස්කර තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) ප්‍රසම්පාදන සැලැස්මේ දී කාල රාමුවන් හඳුනාගෙන තිබුණ ද එම කාල සීමාවන් තුල ක්‍රමානුකූලව ප්‍රසම්පාදනයන් සිදු කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව සැපයුම් 50 සිදු කිරීමට සැලසුම් කර තිබුණද සැපයුම් 06 ක් පමණක් සිදුකර තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | විවිධ වැය ශීර්ෂ යටතේ දරන ලද වියදම් විශ්ලේෂණය කිරීමට හැකිවන පරිදි පරිගණකගත ලෙජරයන් හඳුන්වා නොදීම |
| (ආ) | මූල්‍ය පාලනය | (i) නිශ්ක්‍රීය මුදල් ශේෂයන් පැවතීම.<br>(ii) වැටුප් ලේඛන පිළියෙල කිරීම, පරීක්ෂා කිරීම සහ වැටුප් චෙක්පත් අත්සන් කිරීම පිළිබඳ මනා වැඩ බෙදීමක් කර නොතිබීම.<br>(iii) චෙක්පත් සඳහා අත්සන් කරන නිලධාරීන් නම් කිරීමේ දී කිසිදු මූල්‍ය සීමාවක් පැනවීමෙන් තොරව චෙක්පත්වලට අත්සන් කිරීමේ බලතල පවරා තිබීම.<br>(iv) ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම, චෙක්පත් අත්සන් කිරීම, වැටුප් ලේඛන පිළියෙල කිරීම හා බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම යන කාර්යයන් වෙන් වෙන් පුද්ගලයින් වෙත පවරා නොතිබීම.<br>(v) ජර්නල් වවුචර්පත් සඳහා පරීක්ෂා කල බවට හා අනුමත කල බවට අත්සන් කර නොතිබීම.ජර්නල් සටහන් සනාථ කරන ලියවිලි ජර්නල් වවුචරයට අමුණා නොතිබීම. |
| (ඇ) | ණයගැති පාලනය | ණයගැතියන් හා වෙනත් ලැබිය යුතු මුදල් අප්‍රමාදව එකතුකර නොගැනීම. |
| (ඈ) | මානව සම්පත් කළමනාකරණය | අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා වූ කාර්යභාරය හා ප්‍රමාණය අනුව මානව සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කර නොගැනීම. |
| (ඉ) | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | ව්‍යාපෘති වලින් අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීම සඳහා ව්‍යාපෘති කාර්යයන් සැලසුම් කළ පරිදි කාර්යක්ෂමව හා අප්‍රමාදව ක්‍රියාත්මක නොකිරීම. |
| (ඊ) | වත්කම් කළමනාකරණය | (i) දේපල, පිරියත හා උපකරණ අගය කිරීම, ලේඛන ගත කිරීම, ක්‍රමානුකූලව සිදු නොවීම හා ඒවා අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමව උපයෝජනය නොකිරීම.<br>(ii) ඉන්වෙන්ට්‍රි ලේඛන නඩත්තු නොකිරීම.<br>(iii) අංශ අතර ස්ථාවර වත්කම් ලැබීමේ ලේඛණ හා නිකුත් කිරීමේ ලේඛන පවත්වා නොගැනීම. |
| (උ) | තොරතුරු පද්ධති කළමනාකරණය | දත්ත හා තොරතුරු ආරක්ෂා කරගැනීමේ වැඩපිළිවෙලක් නොමැති වීම. |
| (ඌ) | වාහන පාලනය | 2014 වර්ෂයෙන් පසුව ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂාවක් කර නොතිබීම. |